# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2252/7 - 2021 නොවැම්බර් මස 01 වැනි සඳුදා - 2021.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (2ඈ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

ගාල්ල දිස්ත්‍රික්කයේ බලපිටිය හරස්පොළ ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

**පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව කොළඹ 10, මාලිගාවත්ත, ධීවර අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය හරස්පොළ ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2021.11.01 වැනි දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර)

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

| | | |
|---|---|---|
| 1. | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | 4 වන මහළ, නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10 |
| 2. | ප්‍රාදේශීය සභාව | බලපිටිය |
| 3. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ගාල්ල |
| 4. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | බලපිටිය |
| 5. | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් කාර්යාලය, ගාල්ල |
| 6. | මධ්‍යම පරිසර අධිකාරිය | නො. 104, "පරිසර පියස", කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල |
| 7. | මධ්‍යම පරිසර අධිකාරිය | දිස්ත්‍රික් කාර්යාලය, කොග්ගල |
| 8. | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | ප්‍රාදේශීය කාර්යාලය, උණවටුන, ගාල්ල |




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම යෝජිත ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බැලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2021.11.01 වැනි දින සිට දින 30ක් ඇතුළත වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

**ඉංජි. ආර්. ඒ. එස්. රණවක,**
අධ්‍යක්ෂ ජනරාල්/ වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය, 4 වන මහල,
මාළිගාවත්ත, කොළඹ 10.

දුරකතන අංක : 011 - 2449754, 011 - 2387922, 011 - 2449197.
ෆැක්ස් අංක : 011 - 2438005, 011 - 2472623.

11 - 302

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.